සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2022

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2022

## I පත්‍රය

පැය එකයි.

විභාග අංකය ....................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


### උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත රූපසටහන පිළිබඳ ව නිවැරදි ම ප්‍රකාශය කුමක් ද?



(1) ඔරලෝසුවක් හා ගුරු මේසයක් ඇත.
(2) ළමයින් හයදෙනකු සිටියත් ගුරුවරියක් නොමැත.
(3) රාක්කයෙහි පොත් සහ මල් පෝච්චියක් ඇත.

**2.** පහත රූපසටහනෙහි  සහ  සලකුණු කිරීමට සුදුසු ස්ථාන පිළිවෙළින්,




(1) Ⓐ සහ Ⓔ වේ.
(2) Ⓑ සහ Ⓒ වේ.
(3) Ⓐ සහ Ⓓ වේ.

**3.** පහත කවියෙහි හිස්තැන් සඳහා වඩාත් ම සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

වත්තේ ඇවිදලා ලී කෝටු සොයාලා - …………… කොනක ලී කණු සිටුවාලා
රෙද්දක් ඇදලා වහලයක් …………… - අපේම …………… ගෙයක් තනාලා

(1) කිහිප තියාලා ලස්සන
(2) හතර සදාලා සෙල්ලම්
(3) කිහිප ගෙනැල්ලා සෙල්ලම්

**4.** ගමන් බිමන් යන විට මම යන්නේ
අව්දිවෙලයි සේවය සලසන්නේ
අව්ව වැස්ස හොඳ හැටි හඳුනන්නේ
මා ගැන නොදන්න අයෙක් නොවන්නේ

මෙම කවියේ අදහස වඩාත් හොඳින් ගැළපිය හැක්කේ,

(1) කුඩයට ය. (2) තොප්පියට ය. (3) කබායට ය.

**5.** පහත වාක්‍යයේ හිස්තැන් දෙක සම්පූර්ණ කිරීම සඳහා වඩාත් ම සුදුසු වචන යුගලය කුමක් ද?

පොත් අපේ නෙත් වගේ වන අතර ඒවා ……………… කර ගනිමින්,
කියවීමේ ……………… වැඩිදියුණු කර ගනිමු.

(1) පිරිසිදු, හැකියාව (2) ආරක්ෂා, පුරුද්ද (3) ප්‍රවේශම්, රටාව

**6.** එක්තරා මාසයක පළමුවැනිදා සඳුදාවකි; අවසාන දවස බදාදාවකි. එම මාසයට දින කීයක් තිබේ ද?


(1) 28 (2) 30 (3) 31

Past Papers Wiki



**විභාග අංකය :** ..............................

**7.** පහත රූපයේ දක්නට ලැබෙන වෘත්ත සංඛ්‍යාව කීය ද?



(1) 7

(2) 8

(3) 9

**8.** පහත දී ඇති කොටුදැලෙහි හරහට හා පහළට සෑම පේළියකම හා සෑම තීරයකම ❀, ●, △ යන රූප තුනම යෙදෙන ආකාරයට කොටු පිරවිය යුතුව ඇත.
ඒ අනුව **?** ඇති තැනට යෙදිය යුතු රූපය කුමක් ද?

| | | |
|---|---|---|
| | ❀ | △ |
| | | ● |
| ? | | ❀ |

(1) △

(2) ●

(3) ❀

**9.** ඉදිරියෙන් දී ඇති රූපය එහි ඇති ඊ හිස (↑) පහළට සිටින සේ වට බාගයක් කරකැවූ විට දැකිය හැකි ආකාරය පෙන්වන රූපය කුමක් ද?





(1)




(2)




(3)


**10.**




ඉහත රූපයේ සිටින පිරිමි ළමයා පිටුපසටත්, ගැහැනු ළමයා ඉදිරිපසටත්, අනෙකුත් ඉරියව් වෙනස් නොකර හැරුණු විට ඔවුන් දෙදෙනා සිටින ආකාරය දැක්වෙන නිවැරදි රූපය කුමක් ද?



(1)




(2)




(3)

**11.** පහත රූප පෙළ මගින් දැක්වෙන අවස්ථා හතර කිසියම් අනුපිළිවෙළකට සැකසූ විට එක්තරා ක්‍රියාවලියක් නිරූපණය වේ. එම නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක් ද?





(1) A, C, B, D (2) C, D, B, A (3) D, B, C, A

**12.** බිත්තියක එල්ලා ඇති පුවරු පහක් පහත දැක්වේ. ඒවා සියල්ල භාවිත කර වඩාත් නිවැරදි වැකියක් ලබාගැනීමට **අඩුම** වශයෙන් පුවරු කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?







(1) දෙකක (2) තුනක (3) හතරක

**13.** රටා හතර බැගින් ඇතුළත් රූප තුනක් පහත දී ඇත.



1 රූපය 2 රූපය 3 රූපය

1 සහ 2 රූප දෙකෙහිම ඇති නමුත් 3 රූපයෙහි **නොමැති** රටාව කුමක් ද?

(1)  (2)  (3) 

**14.** දී ඇති ඉලක්කම් සටහනෙහි පහළට හෝ හරහට හෝ එක ළඟ ඇති ඉලක්කම් දෙකක එකතුව 9 වන පරිදි යෙදෙන අවස්ථා සංඛ්‍යාව කීය ද?

| | | |
|---|---|---|
| 1 | 7 | 2 |
| 8 | 1 | 7 |
| 6 | 5 | 4 |
| 3 | 6 | 3 |

(1) 7 (2) 8 (3) 9

**15.** ඔරලෝසුවක වේලාව පෙ.ව. 4.30 යි. එතැන් සිට මිනිත්තු කටුව, හය වාරයක් පැය කටුව පසුකර ගොස් 12 දෙසට යොමු වී තිබෙන විට එම ඔරලෝසුවේ වේලාව කීය ද?

(1) පෙ.ව. 10.00 (2) පෙ.ව. 11.00 (3) මධ්‍යාහ්න 12.00

**16.** අත් ඔරලෝසුවක් එහි මුහුණත උඩු අතට සිටින සේ මේසයක් මත තිරස්ව තබා ඇත. වේලාව ප.ව. 3.00 ට එහි පැය කටුව උතුරු දිශාවට යොමු වී තිබුණි. ප.ව. 3.45 වන විට එම ඔරලෝසුවේ මිනිත්තු කටුව යොමු වී ඇති දිශාව කුමක් ද?

(1) දකුණ (2) බස්නාහිර (3) නැගෙනහිර

**17.** රැස්වීම් ශාලාවක ඇති ආසන 301 සිට 500 තෙක් අංක කර ඇත. ඒවා අතුරෙන් 3 සහ 5 ඉලක්කම් එක ළඟ යෙදෙන අංක සහිත ආසන කීයක් තිබේ ද?

(1) 11 (2) 12 (3) 13

[පස්වැනි පිටුව බලන්න.

Past Papers Wiki




18. කඩදාසි පටි අලවා සැකසූ දම්වැල් කැබැලි පහක් පහත දැක්වේ.



මේවා සියල්ල තනි දම්වැලක් සේ සකස් කිරීමට ගලවා ඇලවිය යුතු කඩදාසි පටි රවුම්, **අවම** සංඛ්‍යාව කීය ද?

(1) 3 (2) 4 (3) 5

19. රටාව අනුව ? ලකුණට ගැළපෙන රූපය කුමක් ද?






(1)




(2)




(3)

20. රූපයක කැබැලි 4 ක් පහත දැක්වේ. ඒවා සමචතුරස්‍රයක් ලැබෙන පරිදි නිවැරදි ලෙස සම්බන්ධ කළ විට ලැබෙන රූපයේ ඇති ඉලක්කම කුමක් ද?




(1) අට (2) හය (3) තුන

21. A රූපයේ දැක්වෙන හැඩයේ කඩදාසියක්, කඩ ඉරි දිගේ නමා B රූපයේ දැක්වෙන හැඩය ලබාගෙන, එහි දැක්වෙන කඩ ඉර දිගේ කපා කැබැලි කරන ලදි. ලැබුණු කැබැලි සංඛ්‍යාව කීය ද?



A රූපය



B රූපය

(1) 2


(2) 4

(3) 6


22. පෝලිමක සුනිල් සහ නිමල් අතර පස්දෙනෙක් ද නිමල් සහ කමල් අතර අටදෙනෙක් ද සිටිති. සුනිල් සහ කමල් අතර සිටිය හැකි ළමයින් සංඛ්‍යාවක් **නොවන්නේ**,

(1) 2 ය. (2) 13 ය. (3) 14 ය.


23. පහත දී ඇති A රූපයේ මැද තිත මත B රූපයේ මැද තිත පිහිටන පරිදි A රූපය මත B රූපය තැබූ විට ලැබේ යැයි ශිෂ්‍යයකු විසින් අඳින ලද රූප තුනක් C, D සහ E මගින් දැක්වේ.




A B



C



D



E

ශිෂ්‍යයා විසින් අඳින ලද රූප අතුරෙන් නිවැරදි ඒවා

(1) C හා D වේ. (2) C හා E වේ. (3) D හා E වේ.


**24.** ළමයින් සමූහයක් තිදෙනා බැගින් කණ්ඩායම් වූ විට එක් අයකු ද හතරදෙනා බැගින් කණ්ඩායම් වූ විට දෙදෙනකු ද පස්දෙනා බැගින් කණ්ඩායම් වූ විට හතරදෙනකු ද ඉතුරු විය. මෙම සමූහය සමන්විත විය හැක්කේ ළමයින් කී දෙනකුගෙන් ද?

(1) 54 (2) 64 (3) 94

**25.** ආච්චිටයි සීයටයි දුවලා 4 දෙනෙක් සිටිති. ඒ හතරදෙනාම විවාහ වී ඇත. එම පවුල් හතරෙහිම දරුවෝ හතරදෙනා බැගින් සිටිති. ඔවුහු සියල්ලෝම ජීවතුන් අතර සිටිති. එසේ නම් මෙම කණ්ඩායමේ කී දෙනෙක් සිටිත් ද?

(1) 21 (2) 22 (3) 26

**26.** කොටුදැලෙහි දැක්වෙන මාර්ග අතුරෙන් දිග වැඩිම මාර්ගය කුමක් ද?




(1) A සිට B තෙක් මාර්ගය

(2) C සිට D තෙක් මාර්ගය

(3) E සිට F තෙක් මාර්ගය

**27.** "අපට ආහාර නොමැතිව වැඩි කාලයක් සිටිය හැකි වුව ද ජලය නොමැතිව සිටිය හැකි කාලය ඉතා කෙටි ය. ශරීරයේ ජලය ප්‍රමාණය අඩුවීමෙන් විවිධ රෝගාබාධවලට ගොදුරුවීමට සිදුවේ. දිනකට අවශ්‍ය ජලය ප්‍රමාණය නියමිත පරිදි පානය කිරීමෙන් ශරීරයේ ක්‍රියාකාරිත්වය නිසියාකාරව පවත්වා ගත හැකි ය."

ඉහත ප්‍රකාශයේ සමස්ත අදහස වන්නේ,

(1) ආහාරයට වඩා ජලය වැදගත් වන බවයි.

(2) රෝගාබාධවලින් මිදීමට ජලය අවශ්‍ය වන බවයි.

(3) ජලය පානය කිරීම අත්‍යවශ්‍ය වන බවයි.


**28.** අවසාන ප්‍රතිඵලයට හේතුවක් සඳහන් **නොවන** වාක්‍යය කුමක් ද?

(1) සචිනි උදෙන්ම අවදි වී සූදානම් වී පාසලට යාමට පිටත් විය.

(2) රුවනි විභාගයෙන් සමත් වූයේ හොඳින් පාඩම් කළ නිසා ය.

(3) බසය නොපැමිණි බැවින් කමනිට පා ගමනින් වෙළඳපොළට යාමට සිදු විය.

**29.** රවුම් කිහිපයකින් යුත් රූපසටහනක් මෙහි දැක්වේ. එම සටහන සමඟ ගැළපිය හැක්කේ පහත දැක්වෙන කුමන ඉදිරිපත් කිරීම ද?



(1) මල්, නෙළුම් මල්, රතු නෙළුම් මල්, සුදු නෙළුම් මල්,


(2) ගස්, අඹ ගස්, පොල් ගස්, පුවක් ගස්

(3) සතුන්, සිව්පා සතුන්, මුවන්, ගිරවුන්

**30.** පසුම්බියක මුදල් නෝට්ටු 8 ක් ඇත. ඒවා රුපියල් 20, රුපියල් 50 හා රුපියල් 100 වටිනාකම්වලට අයත් වේ. රුපියල් 50 හා රුපියල් 100 නෝට්ටු ගණන සමාන වේ. පසුම්බියේ තිබිය හැකි **වැඩිම** මුදල කීය ද?

(1) රු. 270 (2) රු. 490 (3) රු. 600

**31.** එක් දැති රෝදයක් කරකැවෙන විට අනෙක් දැති රෝද දෙක ද කරකැවෙන පරිදි සම්බන්ධ කරන ලද A, B, C දැතිරෝද තුනක් රූපයේ දැක්වේ.




B දැති රෝදය ඊතලයෙන් දැක්වෙන දිශාවට කරකැවෙන විට A සහ C දැති රෝද දෙක කරකැවෙන දිශා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 



(2) 

(3) 



**32.** පහත සටහනේ එක් එක් කොටුව තුළ සඳහන් පොත, එයට ඉදිරියෙන් සහ ඉහළින් නම් සඳහන් ළමයින් විසින් කියවා ඇත. හීන්සැරය සහ තවත් පොතක් හතරදෙනාම කියවා ඇත්නම් හිස් කොටුවේ සඳහන් විය යුතු පොත කුමක් ද?

| | **දිල්කි** | **නුවන්** | **පවනි** |
|---|---|---|---|
| | | | හීන්සැරය |
| | | අපේ ගම | මඩොල්දූව |
| **පැතුම්** | හීන්සැරය | හත්පණ | |


(1) හත්පණ
(2) මඩොල්දූව
(3) අපේ ගම

**33.**  වේ නම් ? ------  වන පරිදි

? ලකුණට ගැළපෙන රූප කට්ටලය කුමක් ද?


(1)  (2)  (3) 

**34.** රූපයේ දැක්වෙන පරිදි A, B හා C සමාන භාජන තුනක ජලය අඩංගු වේ. ඒවායින් A ට වඩා වැඩිපුර B වල ඇති ජලය ප්‍රමාණයත්, B ට වඩා වැඩිපුර C වල ඇති ජලය ප්‍රමාණයත් සමාන වේ. A භාජනයේත්, C භාජනයේත් ඇති ජලය ප්‍රමාණවල එකතුව, B භාජනයෙහි ඇති ජලය ප්‍රමාණය මෙන් දෙගුණයකට,





(1) වඩා අඩු වේ. (2) වඩා වැඩි වේ. (3) හරියටම සමාන වේ.

**35.** රූපයේ දැක්වෙන්නේ කුඩා බිමක් කොටස් හතකට වෙන් කර ඇති ආකාරයයි. පොදු මායිම් දෙපස ඇති කොටස්වල එකම මල් වර්ගය නොමැති වන සේ මෙම කොටස් හතෙහි වගා කිරීම සඳහා **අඩුම** වශයෙන් මල් වර්ග කීයක් අවශ්‍ය වේ ද?



(1) 3 (2) 4 (3) 5

**36.** රූපයේ A කොටුවේ සිට B කොටුවට, පහත දී ඇති කොන්දේසි අනුව ගමන් කළ යුතු ය.




- A කොටුවෙන් ආරම්භ කළ යුතු ය.
- සෑමවිටම යාබද කොටුවක් හරහා ගමන් කළ යුතු ය.
- පහළ කොටුවකට පැමිණි විට යළි ඉහළ කොටුවකට ගමන් කළ නොහැකි ය.


මේ අනුව A කොටුවේ සිට B කොටුවට ගමන් කළ හැකි **උපරිම** මාර්ග සංඛ්‍යාව කීය ද?

(1) 4 (2) 8 (3) 10

**37.** හිස්වැසුම් තුනක් අතුරෙන් එකක් කළු පාට ය. එකක් සුදු පාට ය. එකක් රතු පාට ය. ගීතාට කළු පාට හිස්වැසුම **නොලැබෙන පරිදි** මෙම හිස්වැසුම් තුන ගීතා, අමර සහ සමන් අතර බෙදා දිය හැකි එකිනෙකට වෙනස් අකාර කීයක් තිබේ ද?

(1) 2 (2) 4 (3) 6


**38.** විශාල ලී කුට්ටියක සෑම මුහුණතකම කළු පාට තීන්ත ආලේප කර ඇත්තේ රූපයේ දැක්වෙන පරිදි එකම ආකාරයකට ය. විශාල ලී කුට්ටිය, හරිහතරැස් කුඩා ලී කුට්ටි ලැබෙන සේ ඇඳ ඇති රේඛා දිගේ කපා වෙන් කරනු ලැබේ. එකම මුහුණතකවත් තීන්ත ආලේප **නොකළ** කුඩා ලී කුට්ටි කීයක් ලැබේ ද?



(1) 14 (2) 15 (3) 16

**39.** රූපයේ ඇත්තේ නගරයක දළ සැලැස්මක කොටසකි. ළමයකු පහත දක්වා ඇති ආකාරයට ගමන් කර තිබේ.

- නිවසෙන් ආරම්භ කර මංසන්ධිය තෙක් ගමන් කිරීම
- මංසන්ධියෙන් දකුණට ඇති මාර්ගය දිගේ ඉදිරියට ගමන් කිරීම
- ඊළඟට හමු වූ මංසන්ධියෙන් වමට හැරී පාසල වෙත ගමන් කිරීම




ඒ අනුව පහත සඳහන් ඒවායින් නිවැරදි වන්නේ කුමක් ද?

(1) ඔහුගේ වම් පසින් වැවක් ද දකුණු පසින් කඩයක් ද දක්නට ලැබුණි.

(2) ඔහුගේ දකුණු පසින් වෙළඳපොළ ද වම් පසින් තැපැල් කන්තෝරුව ද දක්නට ලැබුණි.

(3) ඔහුට වම් පසින් වගාබිම දක්නට ලැබුණේ ක්‍රීඩාපිටිය පසු කිරීමට පෙර ය.

**40.** එක්තරා නගරයක පාසලේ සිට රෝහලට යෑමට අවශ්‍ය උපදෙස් පහත පරිදි වේ.

| |
|---|
| ප්‍රධාන දොරටුවෙන් පිටතට පැමිණ දකුණට හැරී මීටර 100 ක් යන විට හමුවන මංසන්ධියෙන් වමට හැරී මීටර 150 ක් යන විට දකුණු පසින් රෝහලේ ප්‍රධාන දොරටුව හමුවෙයි. |

ඒ අනුව රෝහලේ සිට පාසලට පැමිණීමට අවශ්‍ය උපදෙස් නිවැරදිව ලබාදීම සඳහා පහත වැකියෙහි හිස්තැන්වලට ගැළපෙන තොරතුරු පිළිවෙළින් සඳහන් පිළිතුර කුමක් ද?

| |
|---|
| ප්‍රධාන දොරටුවෙන් පිටතට පැමිණ ............... හැරී මීටර 150 ක් යන විට හමුවන මංසන්ධියෙන් .............. හැරී මීටර 100 ක් යන විට .............. පාසලේ ප්‍රධාන දොරටුව හමුවෙයි. |

(1) වමට, දකුණට, වම්පසින්

(2) වමට, දකුණට, දකුණුපසින්

(3) දකුණට, වමට, වම්පසින්

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2022

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2022

## II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය** :...............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ✳ ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ✳ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- ✳ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ✳ පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- ✳ පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- ✳ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවැනි පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවැනි පරීක්ෂක** පළමුවැනි පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

මා සිටුවන ලද අඹ පැළය දැන් විශාල ගසකි. නිවස අසලින් ගලා යන දොළ පහර දෙසට නැමුණු අඹ අත්ත ගෙඩිවලින් බර වී ඇත. එම අඹ ගස මීට වසර පහකට පෙර මා පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් කළ දිනය සිහිවීමට මා අතින් ම සිට වූ බව අම්මා කී අයුරු මට තවම මතකයි. තාත්තා ගෙනැවිත් දුන් ඒ කුඩා අඹ පැළය සිටුවා, අම්මා, තාත්තා, අක්කා සහ මා විසින් එය ආදරයෙන් රැක බලා ගනු ලැබුවේ පවුලේ ම දරුවකු සේ ය. ගසේ මුලින් ම සැදුණු ගෙඩි කිහිපය මගේ පන්තියේ ගුරුතුමිය ඇතුළු යහළුවන්ට බෙදා දුන්නේ ඉමහත් සතුටිනි. සියලු දෙනා ම ඒවා ප්‍රීතියෙන් භුක්ති වින්දෝ ය. "අමල් මෙන් ම පන්තියේ අනෙක් සියලු දෙනාමත් පැළ සිටුවීම සහ රැක බලා ගැනීම ඉතා වැදගත් " යැයි පවසමින් ගුරුතුමිය මගේ ක්‍රියාව අගය කළා ය.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) අඹ පැළය සිටුවන ලද්දේ කවුරුන් විසින් ද?

............................................................................................................

(ii) අඹ පැළය සිටුවන ලද්දේ කුමක් සිහිවීම සඳහා ද?

............................................................................................................

(iii) අඹ පැළය රැක බලා ගත්තේ කවුරුන් ද?

............................................................................................................

(iv) ගෙඩිවලින් බර වී ඇති අඹ අත්ත පිළිබඳ ව මෙහි විස්තර කර ඇත්තේ කෙසේ ද?

............................................................................................................

(v) ගුරුතුමිය පැවසූ පරිදි ඉතා වැදගත් වන්නේ කුමක් ද?

............................................................................................................

(vi) 'සතුටින්' යන්නට අර්ථයෙන් සමාන පදයක් මෙම ඡේදයේ සඳහන් වී ඇත. එම පදය කුමක් ද?

............................................................................................................

**2.** පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි** නම් '✓' ලකුණ ද **වැරදි** නම් '**×**' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) මම කෑමට පෙර අත් සෝදමි. (.........)

(ii) සමන් කෞතුකාගාරය නැරඹීමට යති. (.........)

(iii) අක්කා ජන කවියක් තාලයට ගායනා කරයි. (.........)

(iv) මෙවර පැවැත්වූ චිත්‍ර තරගයෙන් ඔහු ප්‍රථම ස්ථානය දිනා ගත්තා ය. (.........)

(v) වනාන්තර එළිපෙහෙළි කර වර්ෂාව එන තෙක් හේන් ගොවියෝ බලා සිටිති. (.........)

**3.** ඒකවචන, අතීත කාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගලයි (2) තිබුණි (3) බබළති

**4.** දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

ඉඩම / පිහිටි / අපේ / බහුල ය / නිවස / විසිතුරු / ගස්වැල්වලින්

............................................................................................................

............................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

විභාග අංකය :..............................

**5.** පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (1) සෝසාව (2) සෝෂාව (3) ගෝශාව

(ii) (1) නිශ්ශබ්ද (2) නිශ්සබ්ද (3) නිශ්ශබ්ධ

**6.** පහත සඳහන් වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

ගෙවිලියෝ උදැසන ම කුඹුරට ඇඹුල ගෙන ගියෝ ය.

..............................................................................................................................

**7.** 'ආරම්භය' යන්නට විරුද්ධ පදයක් ලියන්න.

..............................................................................................................................

**8.** පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්ථාව පිරුළ තිත් ඉර මත ලියන්න.

යමක් කිරීමට උත්සාහ කර එය කර ගත නොහැකි විට එහි අගුණ කීම.

..............................................................................................................................

..............................................................................................................................

**9.** පාසල අවසන් වී සමන් නිවසට දිව ආවේ වසු පැටියා සමග සෙල්ලම් කිරීමට ය. වතුර පුරවා ගත් බාල්දිය රැගෙන වසු පැටියා ආසන්නයේ තබා පසෙකට වී ඔහු ඒ දෙස බලා සිටියේ ය.

ඉහත වගන්තිය ඇසුරෙන් උදාහරණයක් බැගින් දී පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම | ස්ථාන නාම |
|---|---|---|---|
| (i)...................... | (ii)...................... | (iii)...................... | (iv)...................... |

**10.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



| | | | |
|---|---|---|---|
| | | | |

(ii)



| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

**11.** පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) the/is/pencil/My/table/on:.......................................................................

(ii) my / play / I / friends / with :.......................................................................

**12.** එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) Sugar :.................................. (ii) Rainbow :..................................

**13.** 'තාමරෙයිප්පූ (தாமரைப்பூ)' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

..............................................................................................................................

**14.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

මට බෝලයක් දෙන්න :..............................................................................................

**15.** 51030 සහ 51300 යන සංඛ්‍යා දෙකෙන් කුඩා සංඛ්‍යාව **අකුරෙන්** ලියන්න.

..........................................................................................................................

**16.**

| 5 |
|---|
| 7   9 |

කොටුව තුළ ඇති සියලු ම ඉලක්කම් භාවිත කරමින් එකස්ථානය සහ සියස්ථානය යන ස්ථාන දෙකට ම 5 යෙදෙන, ඉලක්කම් හතරේ සංඛ්‍යාවක් ලියන්න.

..........................................................................................................................

**17.** පහත සංඛ්‍යා තුන ආරෝහණ පිළිවෙළට නැවත ලියන්න.

25971, 15037, 25791 : ..........................................................................

**18.** පහත සංඛ්‍යා රටාවේ ඊළඟට ආයුතු සංඛ්‍යා **දෙක** ලියන්න.

3, 9, 15, 21, ........... , ...........

**19.** වේලාව පස්වරු තුන පසුවී මිනිත්තු තිහ, පැය විසිහතරේ ඔරලෝසුවේ දැක්වෙන (සම්මත) ආකාරයට පහත කොටුව තුළ ලියන්න.

| .............. : .............. |
|---|


**20.** එක් පෙට්ටියක පැන්සල් 6 බැගින් ඇත. එවැනි පෙට්ටි 120ක ඇති පැන්සල් ගණන කීය ද?

..........................................................................................................................

**21.** සිසුන් 175ක්, කණ්ඩායම් 5කට වෙන් කළහොත් එක් කණ්ඩායමකට අයත්වන සිසුන් ගණන කීය ද?


..........................................................................................................................

**22.**



රූපයේ අඳුරු කළ කොටස 'හතරෙන් පංගු' කීය ද? : ..........................................

**23.** කොටු ජාලයේ තිබෙන රූප කොටස සමමිතික රූපයක් ලැබෙන පරිදි සම්පූර්ණ කරන්න.



**24.** A, B, C නගර තුනකි. A සිට B හරහා C දක්වා ඇති මාර්ගයේ දිග 15km 550m කි. A සිට B තෙක් මාර්ගයේ දිග 7km 750m ක් නම් B සිට C තෙක් මාර්ගයේ දිග කොපමණ ද?

: ........... km ........... m

**25.** එක මල්ලක හාල් 2kg 50g ක් ද තවත් මල්ලක හාල් 5kg 750g ක් ද ඇත. මලු දෙකේ ම ඇති හාල්වල මුළු බර කොපමණ ද?

: ........... kg ........... g

[පස්වැනි පිටුව බලන්න.

**26.** භාජනයක ජලය 5150 ml ක් ඇත. එහි ඇති ජල ප්‍රමාණය ලීටර් සහ මිලිලීටර්වලින් ලියන්න.

: ........... l ........... ml

**27.** පාර්සලයක බර මැනීමේදී තරාදියේ එක් තැටියකට පාර්සලය ද අනෙක් තැටියට පහත රූපයේ දැක්වෙන පඩි තුන ද යොදා ගන්නා ලදී. එසේ නම් පාර්සලයේ බර කීය ද?




: ........... kg ........... g

**28.** රුපියල් 15යි සත 50කට පෑනක් සහ එකක් රුපියල් 75 බැගින් අභ්‍යාස පොත් දෙකක් මිලදී ගත්විට ගෙවිය යුතු මුළු මුදල කීය ද?

: රුපියල්........... සත ...........

**29.** පැයක් තුළ පාරක ගමන් කරන ලද වාහන පිළිබඳ තොරතුරු සිසුවකු විසින් පහත අයුරින් වගුවක සටහන් කර ඇත.

| වාහන වර්ගය | වාහන ගණන |
|---|---|
| බයිසිකල් | \|\|\|\|\| \|\|\|\|\| |
| ත්‍රිරෝද රථ | \|\|\|\|\| \|\|\|\|\| \|\| |
| බස් රථ | \|\|\|\|\| \|\|\| |
| ලොරි රථ | \|\|\|\|\| \|\|\| |

(i) වැඩි ම සංඛ්‍යාවක් ගමන් කර ඇත්තේ කුමන වර්ගයේ වාහන ද ?

: ..............................................

(ii) ලොරි රථවලට වඩා ගමන් කළ බයිසිකල් ප්‍රමාණය කොපමණ ද ?

: ..............................................

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න**.

**30.** සුළඟ මගින් ව්‍යාප්ත වන බීජයකට නිදසුනක් වන්නේ කුමක් ද?

(1) කජු (2) පොල් (3) වරා

**31.**

| සත්ත්වයා | ආහාර |
|---|---|
| නයා | මීයන්, ගෙම්බන් |
| මොනරා | සර්පයින්, වී කරල් |
| ගවයා | තණකොළ, පිදුරු |

ඉහත වගුවට අනුව සර්ව භක්ෂක ගණයට අයත් සත්ත්වයා වන්නේ,

(1) නයා ය. (2) මොනරා ය. (3) ගවයා ය.

**32.** යකඩ බහුල ආහාරයකට උදාහරණයකි,

(1) සාරණ. (2) දෙල්. (3) කෙසෙල්.

**33.** දෛනික ආහාර වේල් අතරින් පුද්ගලයකුට වඩාත් වැදගත් වන ආහාර වේල කුමක් ද?

(1) උදෑසන ආහාර වේල (2) දහවල් ආහාර වේල (3) රාත්‍රී ආහාර වේල

**34.** අභ්‍යවකාශ ගතකරන චන්ද්‍රිකා භාවිත කරමින් පණිවිඩ හුවමාරු ක්‍රමයක් නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කර ඇත්තේ කවුරුන් විසින් ද?

(1) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
(2) ආතර් සී. ක්ලාක් මහතා
(3) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

[හයවැනි පිටුව බලන්න.

**35.** තම පදිංචිය පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා හමුවිය යුතු නිලධාරියා කවුද?

(1) විදුහල්පති (2) ග්‍රාම නිලධාරී (3) සමෘද්ධි නිලධාරී

**36.** පුද්ගලයකු ගමන් කිරීමේ දී නිවැරදි ව පාදය තැබිය යුතු ආකාරය වන්නේ පිළිවෙළින්

(1) විලුඹ, පතුල, ඇඟිලි තුඩු ලෙසයි.
(2) ඇඟිලි තුඩු, පතුල, විලුඹ ලෙසයි.
(3) විලුඹ, ඇඟිලි තුඩු, පතුල ලෙසයි.

**37.** පැණි රස ආහාර සහ පිෂ්ටය සහිත ආහාර අධික ලෙස ගැනීමෙන් වැළකිය යුත්තේ පහත කුමන රෝගී තත්ත්වයකින් පෙළෙන කෙනෙකු ද?

(1) දියවැඩියාව (2) අම්ල පිත්ත රෝගය (3) අධික රුධිර පීඩනය

**38.** වැරදි අනුකරණවලින් යුතු භාණ්ඩ විකුණනු ලබන්නේ නම් ඒ පිළිබඳ ව පැමිණිලි කළ යුතු ආයතනය කුමක් ද?

(1) කෘෂිකර්ම සේවා උපදේශක කාර්යාලය
(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
(3) පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය

**39.** දෙහි කල්තබා ගැනීම සඳහා පැරැන්නන් බහුලව භාවිත කළ ක්‍රමයක් වන්නේ,

(1) තැම්බීමයි. (2) වැලි යට දැමීමයි. (3) දුම් ගැස්සවීමයි.

**40.** තිරස්ව එල්ලා ඇති දණ්ඩ චුම්බකයක් නිශ්චලව තිබෙන විට යොමුවන දිශා මොනවා ද?

(1) උතුර - දකුණ (2) ඊසාන - නිරිත (3) නැගෙනහිර - බස්නාහිර

**41.** අයිස් කැටයක් පිරිසිදු ඇල් ජලය සහිත බඳුනකට දැමූවිට අයිස් කැටයට සිදුවන්නේ කුමක් ද?

(1) ප්‍රමාණයෙන් විශාල වේ (2) ජලයේ පාවෙයි (3) වෙනසක් සිදු නොවේ

**42.** ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙකක් සඳහන් පිළිතුර කුමක් ද?

(1) කටුනායක සහ රත්මලාන
(2) කටුනායක සහ මත්තල
(3) මත්තල සහ පලාලි

**43.** ශ්‍රී ලංකාවේ පොදු ස්ථානවල ඇති වැසිකිළි පිරිමි, ගැහැනු ලෙස වෙන් කර දැක්වීමට වඩාත් උචිත කුමන ආකාරය ද?

(1) සම්මත සංකේත මගින් දැක්වීම
(2) සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වීම
(3) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් දැක්වීම

**44.** බෝග වගාවට හිතකර හා අහිතකර යන කරුණ පදනම් කරගෙන මී මැස්සා, ගැඩවිලා හා පිටිමකුණා යන සතුන් නිවැරදිව වර්ග කර ඇති ආකාරය තෝරන්න.

(1)
- හිතකර: ● ගැඩවිලා ● පිටිමකුණා
- අහිතකර: ● මී මැස්සා

(2)
- හිතකර: ● ගැඩවිලා ● මී මැස්සා
- අහිතකර: ● පිටිමකුණා

(3)
- හිතකර: ● මී මැස්සා ● පිටිමකුණා
- අහිතකර: ● ගැඩවිලා

**45.** කොවිඩ් 19 (කොරෝනා) රෝගය ඇති කරනු ලබන්නේ,

(1) බැක්ටීරියාවක් මගිනි. (2) වෛරසයක් මගිනි. (3) දිලීරයක් මගිනි.

[හත්වැනි පිටුව බලන්න.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



6. 'මයිනහම' භාවිත කරනු ලබන්නේ,

(1) වඩු කර්මාන්තයේ දී ය. (2) පතල් කර්මාන්තයේ දී ය. (3) කම්මල් කර්මාන්තයේ දී ය.

7. සිතියමක දක්වා ඇති  සලකුණ මගින් සංකේතවත් වන්නේ,

(1) මහා මාර්ගයයි. (2) දුම්රිය මාර්ගයයි. (3) අධිවේගී මාර්ගයයි.

**48.** ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ කුමක් ද?

(1) ඒවා පිළිබඳ ආකර්ශනීය වෙළඳ දැන්වීම් තිබීම

(2) ඒවා විසිතුරු ඇසුරුම් සහිත වීම

(3) ඒවායේ නිෂ්පාදිත හා කල් ඉකුත්වීමේ දින සඳහන් වීම

**49.** ගෙවතු වගාවේදී සාම්ප්‍රදායික ක්‍රම භාවිතය තුළින් සිදුවන්නේ මින් කුමක් ද?

(1) වස විෂවලින් තොරව එළදාවක් ලැබීම

(2) පස නිසරු වීම

(3) ජලය දූෂණය වීම

**50.** බරවා රෝගය බෝවන්නේ,

(1) රෝගවාහක මැස්සකු මගිනි.

(2) රෝගවාහක මදුරුවකු මගිනි.

(3) රෝගවාහක පුද්ගලයකු මගිනි.

**51.** අකුණු අනතුරුවලින් වැළකී සිටීමට වඩාත් සුදුසු වන්නේ,

(1) එළිමහන් ස්ථානයක රැඳී සිටීමයි.

(2) ජලාශයක ස්නානය කිරීමයි.

(3) ගොඩනැගිල්ලක් තුළ රැඳී සිටීමයි.


**52.** කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී වඩාත් ම සුදුසු වන්නේ,

(1) අන් අයගේ අදහස්වලට ඇහුම්කන් දී සැමවිට ම ඒවාට එකඟ වීමයි.

(2) සැමවිට ම තම අදහස් ඉස්මතු කිරීමට උත්සහ කිරීමයි.


(3) අන් අයගේ අදහස්වලට ඇහුම්කන් දෙමින් තම අදහස් ප්‍රකාශ කිරීමයි.

**53.** වියළි කෝෂ දෙකක් හා වයර් කැබලි යොදාගනිමින් විදුලි පන්දම් බල්බයක් දල්වා ගැනීම සඳහා සකසන ලද අවස්ථා තුනක් පහත දක්වා ඇත. බල්බය **නොදැල්වේයැයි** සිතන අවස්ථාව කුමක් ද?



(1) (2) (3)

**54.** ජලය සහිත බඳුනකට පොල්තෙල් දමා ටික වේලාවකින් දැකිය හැකි ආකාරය නිවැරදි ව නිරූපණය වන්නේ කුමන රූපසටහනකින් ද?




(1) (2) (3)

**55.** කෙසෙල් කොළයක් භාවිත කර බත් පාර්සලයක් සකස් කර ගැනීමේදී කළ යුතු වන්නේ කුමක් ද?

(1) කෙසෙල් කොළය සෝදා වේලා ගැනීම

(2) කෙසෙල් කොළය මතුපිටින් පොලිතින් කොළයක් එළීම

(3) කෙසෙල් කොළය සෝදා මද ගින්දරේ රත්කර ගැනීම

**56.** ශරීරයට උණුවතුර වැටී පිලිස්සුණු අවස්ථාවකදී වහා ම කළ යුත්තේ,

(1) පිලිස්සුණු ස්ථානයේ ආලේපයක් ගැල්වීමයි.

(2) පිලිස්සුණු ස්ථානයට ගලා යන සේ ජලය දැමීමයි.

(3) පිලිස්සුණු ස්ථානය රෙදිකඩකින් ගැට ගැසීමයි.

**57.** ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය සහ ජාතික පක්ෂියා පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) නා සහ වලිකුකුළා

(2) නා සහ කැහිබෙල්ලා

(3) මානෙල් සහ වලිකුකුළා

**58.** ලේන්සුවක වාටි මැසීමට වඩාත් සුදුසු මැහුම් ක්‍රමය වන්නේ,

(1) දම්වැල් මැස්මයි. (2) බ්ලැන්කට් මැස්මයි. (3) නැටි මැස්මයි.

**59.** හදිසි රෝගී තත්ත්වයකදී ගිලන්රථයක් ගෙන්වා ගැනීමට රජය විසින් හඳුන්වා දී ඇති සුවසැරිය සේවයේ දුරකථන අංකය කුමක් ද?

(1) 1090 (2) 1909 (3) 1990

**60.** මිතුරන් සමග උදෑසනින් ම පාසල් යාමට පැමිණෙන ඔබ පාර හරහා ගසක් වැටී තිබෙන අයුරු දකියි. අහල පහල වෙනත් කිසිවෙක් ද නැත. ඔබගේ අධිෂ්ඨානය කෙසේ හෝ පාසල් යාමයි. ඉන් පසුව ඔබ සිදුකරන්නේ කුමක් ද යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය **තුනක්** ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩුවිය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..............................................................................

..............................................................................

..............................................................................

2. ..............................................................................

..............................................................................

..............................................................................

3. ..............................................................................

..............................................................................

..............................................................................

***

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF ALL BOOKS

Including Exercise Books, CR Books, and B5 Books



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**